**ජාතික ළමා සංවර්ධන අරමුදල -  2013**

**------------------------------------------------**

ජාතික ළමා සංවර්ධන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.  කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින්  ලබාගෙන  ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ළමා සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පතුව සඳහා 2013 දෙසැම්බර් මාසය තුළ ලද පොළී රු.75,000 ක් ආදායම් ලෙස හඳුනාගත තිබු නමුත් මුදල් පොත සංශෝධනය කිරිම වෙනුවට ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් ලැබීම් රු.196,362 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහය. 11.1 ඡේදය | අරමුදල පාලනය කිරීම, අන්තර් අමාත්‍යාංශ අධීක්ෂණ කමිටුව මඟින් සිදුකල යුතු අතර අවම වශයෙන් මාසයකට වතාවක් එම කමිටුව රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී එක්වරක් වත් කමිටුව රැස්වී නොතිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන මුදල් චක්‍රලේඛයේ 4.4 (අ) ඡේදය | විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2010, 2011 හා 2012 වර්ෂ වලදී එම වාර්තා සභාගත කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.689,129 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.244,244 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.933,373 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. එම වර්ධනය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.1,138,900 ක ආධාර මුදල ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ළමා දින කොඩි අලෙවිය වූ අතර සමාලෝචිත වර්ෂයේ ලෝක ළමා දින කොඩි අලෙවි කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 22 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 297 ක් වෙත කොඩි 740,850 ක් රු.54,230 ක තැපැල් ගාස්තුවක් වැයකර යවා තිබුණි. මෙම කොඩි අලෙවියෙන් ලැබෙන මුදලින් සියයට 75 ක මුදල් 2013 නොවැම්බර් 30 දිනට පෙර ළමා සංවර්ධන අරමුදල වෙත එවිය යුතු වුවද 2013 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 28 කින් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල එකකින් පමණක් මුදල් එවා තිබුණි. 2014 මැයි 10 වැනි දින වන විටත් කොඩි 519,300 ක් යවා තිබූ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 221කින් මුදල් එවා නොතිබීමෙන් කොඩි අලෙවිය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබූ බව අනාවරණය විය.

(ආ) ඩකා හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සේවා වනිතා ඒකකය ළමා සංවර්ධන අරමුදලට සමාලෝචිත වර්ෂය තුළදී රු.1,138,900 ක මුදලක් ලබා දී තිබූ නමුත් එම මුදල භාවිතයට ගැනීම සඳහා වසර තුළ කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 හඳුනාගන්නා ලද පාඩු

කොඩි අලෙවියෙන් ලැබුණු රු.6,040 ක චෙක්පත් අහරු වී තිබූ අතර එම මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අරමුණු හා තථ්‍ය ලඟාකර ගැනීම් පිළිබඳ ඇගැයීමක් කිරීමට නොහැකි විය

**5.2 අයවැය ලේඛණමය පාලනය**

---------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 50 සිට සියයට 100 ක විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් එකතු කිරීම